සහෝදරයා ළඟ තිබූ ගතිගුණ මෙනෙහි කරද්දීය. හමුදාවට අසු වී මරා දැමූ ගැමුණු සහෝදරයාත් මෙත් මුණ ගැසුනේ තරුපහේ සංචාරක හෝටලයක සාප්පු සංකීරණයකදීය. අප එදිනෙදා කථා කලේ ලංකාවේ සිදුවන තරුණ සංහාරය ගැන විදේශීය මානව හිමිකම් සංවිධාන දැනුවත් කිරීම ගැන ය.

ශිරෝමන්ගේ දේශපාලන ඉතිහාසය ගැන මා වැඩියමක් නොදැන සිටි නමුත් ඔහුගේ සැබෑ නම, ගම, පවුලේ තොරතුරු ආදීය හොඳින්ම දැන සිටියෙමි. ඔහු මා ඉගෙනගත් විදුහලේ අප පවුලේ පස්වැන්නා වන මට බාල තුන්වෙනි මල්ලිගේ පන්තියේ හිටි බව මට යාන්තමට මතක තිබිණ. මේ ලාබාල සහෝදරයාගේ දේශපාලන පිවිතය ඇරඹෙන්නට ඇත්තේ දේශප්‍රේමී ජනතා ව්‍යාපාරයට සම්බන්ධ වූ ශිෂ්‍ය ක්‍රියාකාරියෙකු වශයෙන් යයි මා තුළ විශ්වාසයක් ගොඩ නැගුණේ පැරිසියේදී ද ඔහු ප්‍රදර්ශනය කළ ඇතැම් සුවිශේෂ ගතිගුණ නිසාය.

(පක්ෂයට අනුබද්ධිත ශිෂ්‍ය ව්‍යාපාරය, විශේෂයෙන්ම දේශප්‍රේමී ජනතා ව්‍යාපාරයේ සිටි සරසවි සිසුන් පක්ෂයට මහා ජවයක් සැපයුවාසේම ඔවුන්ගේ ඇතැම් නොමේරූ හදිසි තීරණවල ප්‍රතිඵලයක් ලෙස පක්ෂයට යම් විනාශයක් අත්කර දුන් බවද මගේ පෞද්ගලික නිගමනයයි. එය වෙනම විමසා බැලිය යුතු දෙයකි)
මගේ බිරිඳන්, හත් හැවිරිදි පුත්‍රයාත් ප්‍රංශයට එන්නේ මා පැමිණ වසර දෙකකට පසුවය. 1993 මැයි පළමුවෙනිද උදවෙන්නේ ඔවුන් දෙදෙනා ප්‍රංශයට පා තබා උදවන තෙවන දිනයේදීය. පැරිසියේ මැයි පෙළපාලියට පක්ෂය වෙනුවෙන් සහභාගී වූ සුළු පිරිසට මගේ බිරිඳද දරුවාද ඇතුලත් විය.

පක්ෂයේ අනිංසක හිතවතෙකුට යතුරක් සම්බන්ධයෙන් වූ ප්‍රශ්නයකදී ශිරෝමන් යකෙකු මෙන් බෙරිහන්දී ඇශයට කඩා පැන්නේ මැයි පෙළපාලියට එක්වීමට බලාසිටි අවස්ථාවේදීය. සැබවින්ම එසේ හැසිරිය හැක්කේ විප්ලවවාදී පොලිසිකාරයෙකුට පමණි.

මා මේ ලියන්නේ ඉතිහාසයකි. එවිට සිදුවූ සත්‍යයම පැවසිය යුතු හෙයින් යම් යම් දේ හෙළිදරව් කිරීමට සිදුවීම නෙවැළැක්විය හැක්කකි.

පසුව මම මෙම සිද්ධිය තුලදබල ලෙස විවේචනයට ලක් කලෙමි.

"මම බැන්නා කියලා ඒ සහෝදරයාට ගනනක් නෑ. මම එයාට සෑහෙන්න උදව් කරලා තියෙනවා." ශිරෝමන් කරුණු දක්වන්නට විය, 'ඒක උත්තරයක් නෙවි. පක්ෂයේ සංවිධායක සහෝදරයා ඒ විදියට හැසිරෙන එක ලස්සන නෑ. අනික උදව් කරලා තිබුණය කියලා එහෙම බතින්න අයිතියකුත් නෑ."

ශිරෝමන් සංවිධායක ධුරය දැරූ කාලය තුල මෙවැනි පොලිස්කාරකම් වරින්වර අසන්නට ලැබිණ. පසුව පැරිසිය හැරදා ගයි ශිරෝමන් 1994 දී බලයට පත් වූ චන්ද්‍රිකා රජයේ ඇමතිවරයෙකු වූ මංගල සමරවීමගේ අමාත්‍යාංශයේ යම් රාකාරියක නිරතව සිටිනු දුටුවේ යයි මට පවසන ලද්දේ කැමිලෝ සහෝදර්යා විසිනි.

පක්ෂයේ ලන්ඩන් ශාඛාව හා පක්ෂ නායක සෝමවංශ අමරසිංහ සහෝදරයා අතර විරසකයක් හටගෙන ඇතැයි අභ්‍යන්තර ආරංචි මාර්ග ඔස්සේද, ඇතැම් මාධ්‍ය ඔස්සේද, යුරෝපා රටවල වෙසෙන පක්ෂ හිතවතුන් දැනගන්නා විට එය තදබල අර්බුදයක් හා වෙන්වීමක් තරමටම දුරදිග ගොස් තිබුණි.

ඩේවිඩ්සන් මෙම අර්බුදයේ ප්‍රධාන භූමිකාවක් රඟ දැක්වූයේ තිරය පිටුපස සිටිමිනි. එය වෘත්තීය 'ලික්විඩේටර් වරයෙකුගේ' (දියකර හැරින්නෙකුගේ) වැඩ කොටසක් සේ හැඳින්වීම නිවැරදිය. ලන්ඩන් සොයුරන් හා අමරසිංහ සහෝදරයා අතර වූ ගින්න තෙල් දමමින් එය අවුළුවාලීමට උත්සාහ කල ඩේවිඩ්සන්, පැරිසියේ පක්ෂයේ හිතවතුන්ද, පක්ෂයට කිසිසේත්ම සම්බන්දයක් නොමැති පිටස්තර පුද්ගලයන්ද හමුවෙමින් අමරසිංහ සහෝදරයා හෙළාදැක අවමානයට හා අපකීර්තියට පත්කරන ලද්දේ ජ.වි.පෙ. වැනි විනය ගරුක, වැදගත් පක්ෂයක වැඩකල කෙනෙකු ලෙස නොව අනුන්ට අපහාස කරමින් ඕපදූප කියමින් ගමේ ගොඩේ ඇවිදින නුගත් ගැහැනියක මෙනි.

මා මේ ලියන්නේ ඉතිහාසයකි. එවිට සිදුවූ සත්‍යයම පැවසිය යුතු හෙයින් යම් යම් දේ හෙළිදරව් කිරීමට සිදුවීම නෙවැළැක්විය හැක්කකි.

රජයත්, ආරක්ෂක අංශයත් , ජනමාධ්‍යත්, රටේ ජනතාවත් , රටින් බැහැරව සිටි ශ්‍රී ලාංකිකයනුත් දැන සිටියේ ජ.වි.පෙ. නව නායක සෝමවංශ අමරසිංහ ලන්ඩනයේ සිටින බවකි. එහෙත් අමරසිංහ සහෝදරයා සිය බිරිඳත් පුත්‍රයාත් සමග පදිංචිව සිටියේ ප්‍රංශයේ පැරිසියේ ය.

අමරසිංහ සහෝදරයා ප්‍රංශයට එන කාලය වනවිට පැරිසියේ සිටි පක්ෂ සංවිධායක ඩේවිඩ්සන් බැවින් නායක සහෝදරයාගේ ඉඳුම් හිටුම් ප්‍රශ්නය හා වෙනත් ප්‍රශන්වලදී උදව් කළයුතු වූයේ ඔහුය.

ඩේවිඩ්සන් පසුව කරන ලද ප්‍රධාන චෝදනාවක් වූයේ අමරසිංහ සහෝදරයා මාස ගණනක් ඇතුළත නවාතැන් දෙකක්ම මාරුකර තෙවැන්නට ගිය බවත් මේ ගෙවල් මාරු කිරීමේදි තමන් බොහෝ කරදර විඳි බවත් ගොඩනැගිල්ලක හත්වැනි තට්ටුවේ වූ කාමරයකට ගියවිට කරමත තබාගෙන ඇඳුම් පැලඳුම් පෙට්ටි පඩිපෙළ දිගේ උඩට ගෙන ගියේ තමා බවත්, ඇතැම් විටක අමරසිංහ සහෝදයාගේ පුත්‍රයා වඩාගෙන එම තට්ටු හතම නැග්ග බවත් එහෙත් අමරසිංහ සහෝදරයා පසුව හඳුනාගත් හිතවතෙකුගේ මාර්ගයෙන් හතර වැනි තවාතැනක් හොයාගෙන තමාටත් නොදන්වා හොර රහසේම එහි ගිය බවත්ය.

ඩේවිඩ්සන් කරන මෙම චෝදනාව අසත්‍යයක් නොවනමුත් තමාගේ ආරක්ෂාව සම්බන්දයෙන් අමරසිංහ සහෝදරයා එසේ කිරීම ගැන දොස් කිව නොහැක. මන්ද ඔහු අතිසූක්ෂම මිනිසෙකි. දේශීය වශයෙන් හෝ ජාත්‍යන්තර වශයෙන් ක්‍රියාත්මක වියහැකි පිවිත තර්ජනයක් ඔහුට තිබිණ.

ඩේවිඩ්සන් තරමක වාචාලයෙකි. වගකීම් රහිත කථා කියන්නෙකි. ඔහු අතින් කෙසේ වෙතත් ඔහුගේ සගයින් අතින් හෝ අමරසිංහ සහෝදරයා පදිංචි ස්ථානය හෙළිදරව් වීමට ඉඩ තිබුනේය. එහෙත් යනතැන නොකීවාට තමා වෙනත් තැනකට යනවබව කීවානම් එය කෙනෙකු සතු ගුණධර්මයක් බව ඩේවිඩ්සන් නගන තර්කයද බැහැර කල නොහැකිය.

ප්‍රංශයට මුලින්ම පැමිණෙන ඕනෑම කෙනෙකුට භාෂා ප්‍රශ්නය ප්‍රශ්නයක් බවට පත්වෙයි. ප්‍රංශයේ සියලු කටයුතු ප්‍රංශ භාෂාවෙන්ම සිදුවීම එයට හේතුවය.

අමරසිංහ සහෝදරයාට ද එම තත්තවය පොදු විය. ප්‍රංශ රජයේ ආයතන හා ගනුදෙනු කරද්දීද, ලිපි ලේඛණ නුවමාරු කරගැනීමේදී භාෂාව දත් කෙනෙකුගේ සහාය ලබාගැනීම අත්‍යාවශ්‍ය විය. ඩේවිඩ්සන්ගේ ප්‍රංශ භාෂා දැනුමේ අඩුපාඩු තිබුණෙන් ඔහු මේ සඳහා යොදවා ගත්තේ ඔහුගේ සගයින් දෙදෙනෙකු වන බැස්ටිල් සහ ආර්නෝල්ඩ් ය.

පැරිසියේදී පක්ෂයට සම්බන්ධ වූ බැස්ටිල්ට පක්ෂයේ නායකයාට තාවකාලිකව හෝ ගුරුවරයෙකු වීමට ලැබීම ගැන ස්වයං අභිමානයක් දැනෙන්නට ඇත. ප්‍රංශයට පැමිණෙන ආගන්තුකයන් මුලදී මෙම භාෂා පරිවර්තකයන්ගේ සහාය ලබාගන්නා නමුදු ඔහු හෝ ඇය දක්ෂයෙකු වේ නම් ඉතා ඉක්මනින් තමාගේ වැඩ තනිවම කර ගැනීමට ඉගෙන ගනියි. ඉදින් අමරසිංහ සහෝදරයාට බැස්ටිල්ගේ සේවය තවදුරටත් අනවශ්‍ය වූ විට ඔහුගේ අභිමානය පෙරළෙන්නට ඇත්තේ වෛරයකටය. එබැවින් පක්ෂයෙන් ඉවත් කරන ලද ඩේවිඩ්සන් අමරසිංහ සහෝදරයාට තැන නොතැන නොබලා ඉතා බාල ගනයේ අවලාද වපුරමින් යනවිට ඔහුගේ අගසව් වූයේද මේ බැස්ටිල්ය.

බල්ලා විසින් වලිගය තටවනවා මිස වලිගය විසින් බල්ලා තටවන්නේ නැතැයි යන කියමක් තිබේ.

ජනතා විමුක්ති පෙරමුණ වැනි පක්ෂයකට නම් මෙම කියමන අදාළ නොවන අවස්ථා තිබේ. මන්ද නායකයන් පාලනය කිරීමට අවස්ථාව උදවෙයි. එහෙත් මා දන්නා තරමට පැරිසියේ නම් එවැනි සුදුසුකම් සැපිරූ සාමාජිකයන් නොසිටියහ. කෙසේ වුවද යුරෝපයට ඇතුළු වීමෙන් පසුව උද්ගත වන ප්‍රශ්නවලදී පක්ෂයේ නව නායකයා නිවැරදිව ක්‍රියාකළ ප්‍රමාණයට සියයට කොපමණ යන්න (%) විවාදාත්මක ප්‍රශ්නයකි.

මතු සම්බන්ධයි

YSL
Migration Services

MIGRATION SERVICES

We specialise in

Skilled Migration
State Sponsorship
Parent, Spouse and Student Visa

Yashodhara Sarachchandra Liyanaarachchi
(Registered Migration Agent)
MARN: 0746956

0430 359 006

26 Sallybrook Circuit, Narre Warren, VIC 3805
Tel: **03 8794 9818** | **03 8794 9297** :Fax

yasho@yslmigration.com
www.yslmigration.com

Lead Design House

MIGRATION AGENT REGISTERED mara.com.au REGISTRATION NUMBER 0746956

MIA
MEMBER OF MIGRATION INSTITUTE OF AUSTRALIA